# ජාතික සමගට එක්වූ සමූහ ගොවිපළ



ඩී. ඇස්. හපුතන්තිරි ගෙනි

එදා හරි දීප්තිමත් දවසක්. හිමිදිරි උදයේ මීදුම් සළු සිසාරා අප ගමන් කළ ගුවන් යානය රත්මලානේ ගුවන් තොටුපළින් අහස ට නැගෙද්දී ලා හිරු රැස් දහරින් ලස්සන කඳුවැටි සාරවත් කෙත් හා වතුපිටි නැවෙමින් තිබුනා.

පැයකුත් විනාඩි කීපයක් තුළදී කොළොම් පුරයේ සිට ත්‍රිකුණාමලයට සේන්දුවූ ගුවන් යානය යළිත් පොළවට පතිතවෙද්දී අප දුටුවේ කාගේත් නෙත්, සිත් පිනවන දර්ශනයක්. චීන වරායේ, ගුවන් තොටුපළ වටා හැම බිම් අඟලකම වවා තිබුණ වී, මිරිස්, සෝයා බෝංචි වැනි වගාවන් වල හමුදා භට සින් වැඩ කරන හැටි අපේ දෙනෙතට හමු වුනා.

එතැන් සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්වේච්ඡා නිලධාරීන් දෙපළක් වන පියසර නිලධාරී ඇල්. ඩී. සී. ගුණවර්ධන මහතාත් නියමු නිලධාරී ඇන්ටන් ප්‍රනාන්දු මහතාත් ජීප් රථයකින් අප කැඳවාගෙන ගියා. ත්‍රිකුණා මලයේ අතීත සිද්ධීන් සිහිපත් කරමින් එහි සිට සැතැපුම් 17 ක් පමණ දුර, අනුරාධ පුර පාරේ ගමන් කළ අප මහපාරින් හැරී තවත් ගුරු පාරක මොරවැව පැත්තට ගියා.

මෙසේ සැතපුම් තුනක් පමණ මඟ ගෙවද්දී මොරවැව දෙසින් හැමූ මඳ සුළඟට ලෙලදෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කොඩි යත්, තාවකාලික ගොඩනැගිලි කීපයකුත් ඒ අවට තැනින් තැන වැඩ කරන තරුණ සින් සමූහයකුත් අපේ දෙනෙතට හමු වුනා. එතැනට ගොස් නතර කළ වාහනයෙන් ඇල්. ඩී. සී. ගුණවර්ධන හා ඇන්ටන් ප්‍රනාන්දු යන මහතුන් අපවද එහි කැඳවා ගෙන ගියා.

මං මේ ඔබට කීවේ මීට මාස කීපයකට පෙර වූ සිද්ධියක්. එදා අප ගියේ ත්‍රිකුණා මල දිස්ත්‍රික්කයේ මොරවැව පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගොවිපල නැරඹීමට. එහිදී ටික වේලාවක් ගමන් වෙහෙස නිවාගත් අපට ගුණවර්ධන මහතා මෙම ගොවිපළ ගැන හැඳින්වීමක් කළා.

**නිෂ්පාදන වසරේ වගා සටනේදී හමුදා වල මද දිය හැක්කේ ලොකු සහයෝගයක්. මේ නිසා කටුනායක හා ඒකල ගොවිපල් දෙකක් පටන් ගත්තා. ඒ අතර අප අදහස් කළා ගුවන් හමුදාව විසින් වෙනම ගොවි ව්‍යාපාර යක් අරඹිය යුතුය කියා. ඒ සඳහා ඉඩමක් සොයමින් සිටි අපට ත්‍රිකුණාමලයේ දිසාපති තුමාගේ සහයෝගය ද ඇතිව මේ ඉඩම ලබා**

**ගැනීමට හැකිවුනා. පසුගිය අවුරුද්දේ ජූලි 1 දා වැඩ ඇරඹූ මේ ගොවිපලේ දැනට ආහාර බෝග වර්ග රාශියක්ම වගාකර ඇති අතර, මෙම වැඩ කරනු ලබන්නේ තරුණ වියේ පසුවන ස්වේච්ඡා භටයින් 39 දෙනෙක් විසිනුයි."**

එදා සීවස් වරුවේත් පසුවදා උදේ වරුවේත් අපි ගොවිපලේ හැම තැනක්ම බලන්න ගියා. මේ ගොවිපල පිහිටල තියෙන්නේ ඉතාමත් ලස්සන පරිසරයක. මොර වැව ඉතාමත් පැරණි වැවක්. 1961 දී ප්‍රතිසංස්කරණය කළ මේ වැවෙන් දැනට අක්කර දෙදහසක් පමණ වූ ගොවීන්ගේ වගා වලට ජලය සපයනව. මේ ගොවිපල තියෙන්නේ වැවට පහළින්. ඒ වුනත් වැවේ ජලය ගොවිපලට ලබාගන්න පුළුවන් කමක් නැ. ඊට ලැබෙන්නේ වැව් ඉවුරට පහළින් රැඳී ඇති සුළු ජල ප්‍රමාණයක් පමණයි. ඒ වුනත් එම ජල ප්‍රමාණය අවුරුද්ද මුළුල්ලේම නොකඩවා පවතින්නක් හෙයින් උපරිම ප්‍රයෝජන ලබා ගත්තොත් එයින් සෑහෙන වපසරියක් වගා කරන්න පුළුවන්. ගොවිපල පස ඉතාමත් සාරවත්. අපි යන විට වී, සෝයා බෝංචි, ඉදල් ඉරිඟු, මිරිස්, කුරක්කන්, බඩ ඉරිඟු, යන ආහාර බෝග වගේම කෙසෙල් වැනි පළතුරු වර්ගත් අල බෝගත්, වගා කරල තිබුන. ඒ අතුරින් ඉතාමත් සාරවත්ව වගා කරල තිබුන අක්කර 65 ක එච් 4, බීජී 11-11 සහ බී. ජී. 34-8, වී වගාවේ අස්වැන්න කපන්න සූදානම් වෙලයි තිබුනේ. නොවැම්බර් මාසේ වන විට මිරිස් පැල විසිදාහකුත්, කෙසෙලේ පැල දෙදාහකුත්, ඉදල් ඉරිඟු හා බඩ ඉරිඟු පාත්ති දෙකකුත්, මුංඇට අක්කර පහළොවකුත්, මයියොක්කා දඬු දොළොස් දාහකුත්, කිරි අල පැල හයසීයකුත්, තෝර පරිප්පු අක්කරයකුත්, සෝයා බෝංචි අක්කර කාලකුත් වගා කරල තිබුන. ඉතාමත්ම ක්‍රමවත්ව වගා කරපු මේ හැම වගාවක්ම පාහේ අපි යන විට අස්වැන්න නෙලන්න ආසන්න වෙලයි තිබුනේ. මේ හැර වට්ටක්කා, පුහුල් වගේ බෝගත් තැනින් තැන වගා කරල තිබුන. එදා රෑ හමුදා කඳවුරේ නිදා ගත් අපට එළිවෙනතෙක් නුදුරු ශබ්ද විටින් විට ඇසුන. ඒත් ඇන්ටන් ප්‍රනාන්දු මහත්මයා අපට කලින් කියා තිබුණු නිසා අප ඒවායින් කලබල වුනේ නැ. ඔහු පැවසූ අන්දමට රෑ



ගුවන් හමුදා භටයින් විසින් අක්. 65 ක සාරවත් ලෙස වගාකර තිබූ ගොයමේ අස්වැන්න නෙලද්දී.

පහන්වන තෙක් නොයෙකුත් වන සතුන්ගෙන් වගාව රැකගන්න භටයින් විසි දෙනෙක් පමණ මුර සේවයේ යෙදෙනව. වැඩි වශයෙන් හානි පැමිණෙන්නේ වල් අලි, ඌරන් හා ඉත්තෑවන්ගෙන්. උන් පලවාහැරීමට ඔවුන් තුවක්කු රැගෙන තැනින් තැන මුර කරනවා. අපට ඇසුනේ ඒවායින් නැගුණු වෙඩිහඬ. අඳුරු වැටීමත් සමඟ තැනින් තැන ගස්වල ලාම්පු පත්තු කිරීම සතුන් බය ගන්වන තවත් ක්‍රමයක්.

පසුවදා උදේ පාන්දර අප අවදිවන විටත් හමුදා භටයින් තම තමන්ගේ වැඩවලට යාමට සූදානම් වෙලයි තිබුනේ. ඔවුන් වැඩ කරන්නේ ක්‍රමවත් කාල සටහනක් අනුවයි. ඔවුන්ගේ දින චරියාවත්, වැඩ සංවිධානයත් ගැන සාජන්ට් වී. කේ. කරුණානායක මහතා අපට විස්තර කළා.


**"හමුදාවක් යටතේ ක්‍රියාත්මක වන මෙවැනි ගොවිපලකට විනය ඉතාමත් අවශ්‍යයි. එය ක්‍රියාත්මක කළ හැක්කේ කාල සටහනක් අනුවයි. ගොවිපලේ නොයෙක් අංශවල වෙනස් වෙනස් වැඩ කටයුතු කරන්න තිබෙනවා. ඒ වැඩ භටයින්ට භාර දිය යුත්තේ කල්පනාකාරී ලෙසයි. එකිනෙකාගේ සහජ හැකියාවන් හා ලැදියාවන් අනුව වැඩ කරන්න අවස්ථාවක් සලසා දීම අපේ එක් අරමුණක්. එය එක් අතකින් ඔවුනොවුන්ගේ දියුණුවටත්, අනික් අතින්**

ගොවිපලේ දියුණුවටත් හේතුවන්නක්. මේ ප්‍රතිපත්තිය අනුගමනය කළහොත් හොඳ ප්‍රතිඵල ලබන්න පුළුවන්. පිටතින් කාර්මික යන් නොගෙන්වා කෝප්‍රල් ලාල් පෙරේරා වගේ තරුණ භටයෙකුට අපේ ට්‍රැක්ටර් යන්ත්‍ර අළුත්වැඩියා කරල ගොවිපලේ සේවයට යොදවන්නත් ඔහුගේ සහජ හැකියාවන් පෙන්වීමටත් අවස්ථාවක් ලැබුනේ ඒ නිසයි.”

ඇත්තෙන්ම මේ ගොවිපලේ තරුණ භටයින් හැම කෙනෙක්ම ඉතාමත් දක්ෂ ලෙස ඉතාමත් සහයෝගයෙන් වැඩ කරන හැටි අපටත් දකින්න ලැබුන. ඔවුන් එහි පැමිණියේ ඕනෑම කටුක පරිසරයක වුවත් වැඩ කිරීමට සූදානමින් බැව් ඒ අය තෝරාගත් ඇල්. ඩී. සී. ගුණවර්ධන මහතා අපට කිව්වා මෙහිදී පැහැදිලිව දකින්න තිබුන.

මෙහිදී සාමූහිකව කෙරෙන ගොවිතැනින්, මේ තරුණ හමුදා භටයින්ට අත්දැකීමක් හා පුහුණුවක්ද ලබාදීම බලාපොරොත්තු වෙනවා. එමගින් ඔවුන් තුළ ඇතිවන ආත්ම විශ්වාසය හමුදා සේවයෙන් වෙන්වූ දිනක ඔවුන්ගේ ගොවිතැන් කටයුතු සාර්ථක කර ගැනීමටද උපකාරී වෙනව. හරිහැටි කළහොත් ගොවිතැන ඉතාමත් සාර්ථක ජීවනෝපායක් බව ඔවුන්ට ඒත්තු යනවා. එය ඔවුන්ට වගේම ජාතියටත් යහපතක්.

**පියසර නිලධාරි (ස්වේච්ඡා) ඇල්. ඩී. සී. ගුණවර්ධන (වමේ) සහ නියමු නිලධාරි (ස්වේච්ඡා) ඇන්ටන් ප්‍රනාන්දු (දකුණේ), ගොවිපල භාරව කටයුතු කරන සාජන්ට් වී. කේ. කරුණානායක (මැද) සමග ඉදල් ඉරිඟු වගාවේදී.**



ගොවිපලේ ඉදිරි වැඩ ඉලක්ක ගැන විමසූ අපට ගුණවර්ධන මහතාත් ඇන්ටන් ප්‍රනාන්දු මහතාත් විස්තර කළේ මෙහෙමයි. “මොරවැවේ කාන්දුවන ජල ප්‍රමාණයෙන් අක්කර 25-30 ක මිරිස්, මුංඇට, ඉදල් ඉරිඟු හා තල යන ආහාර බෝග වගා කිරීමට බලාපොරොත්තු වන අතර මීළඟ මහ කන්නයේදී වැසි ජල සම්පාදනය යටතේ මේ ප්‍රමාණය පුළුල් කිරීමටත් බලාපොරොත්තු වෙනවා. සත්ව පාලනයද අපේ සැලකිල්ලට යොමු වෙලා තියෙන තවත් අංගයක්. දැනට සරකුන් හා එළුවන් සෑහෙන ප්‍රමාණයක් ඇති කරන අතර, විශේෂයෙන් ගව පාලනය මීට වඩා පුළුල් කිරීමට බලාපොරොත්තු වෙනවා. අක්කර දෙදහසක පමණ බිම් ප්‍රමාණයක තණබිම් ඇති කර ගම්බද හරක් ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙම තණබිම් වලින් පමණක් පෝෂණය කර ඇති කරන හරක් රාත්‍රී කාලයේ පමණක් කොටු කිරීමට අදහස් කරනවා. ඒ අතර ධීවර දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මොරවැවේ මසුන් ඇති කිරීමේ ව්‍යාපාරයක් ඇති කිරීමද අපේ තවත් ඉලක්කයක්. එය මසුන්ගෙන් ස්වයංපෝෂිත වීමට වගේම පොර නිපදවීමටද උපකාරී වෙනවා. කිරි මණ්ඩලයේ මිළදී ගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අවශ්‍යතාවය වූ කිරි පයින්ට් 1500 ක් නිෂ්පාදනය නිපදවීමෙන් ඒ කාර්යය ද ඉටු කර ලීමට අවස්ථාවක් සැලසෙනවා. එහි අවට වෙනත් ගොවි ව්‍යාපාර වලටද සැලසෙන සේවයක්. මේ වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීමට සම්පූර්ණ සහාය දෙන බවට සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍යය පිළිබඳ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ආචාර්ය ඒ. බණ්ඩාරනායක මහතා පොරොන්දුවුනා”.


මොරවැව ගොවිපල ගුවන් හමුදාවත්, ගොවිකම් දෙපාර්තමේන්තුවත් අතර ඇඩි සබඳතාවයකට මඟපෑදූ දම්වැල් පුරුක්ක වශයෙන්ද හඳුන්වන්න පුළුවන්. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහාය ඔවුන් නිතර ලබාගන්නාව, මේ ගොවිපලට ළඟදී පැමිණි කෘෂිකර්ම අධ්‍යක්ෂ ආචාර්ය අබේරත්න මහතා ප්‍රයෝජනවත් වැඩ සැලැස්මක් යෝජනා කර තියෙනව අප දැක්කා.

අප සිටියදී එහි පැමිණි ත්‍රිකුණාමල අති රේක දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි හා ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක යන නිලධාරීන් හමුදා නිලධාරීන් සමග අස්වනු නෙලීමේ ශ්‍රමදානයක් පැවැත්වීමට සාකච්ඡා කරනු දැකීම තවත් නිදසුනකි. අවට ගම් වැසියන් තුළද මේ ගොවිපල ගැන තියෙන්නේ ලොකු බලාපොරොත්තුවක් හා විශ්වාසයක්. ගුවන් හමුදාව මහජනයාගේ සේවයට කැප වූවක් යන්න ඔවුන්ම වටහා ගැනීමට මේ ලොකුම අවස්ථාවක්.

හමුදා භටයින් ගොවිපළේ වැඩ කරන්නේ ඉතාමත් සහයෝගයෙන්, සහෝදර පිරිසක් වගෙයි. ඔවුන් තම ජීවිතයට වගේම ගොවි පල්ටත් ආදරෙයි. ඔවුන්ගේ හැම අවශ්‍යතාව යක්ම සපුරාලීමට ගුවන් හමුදාව නිතර මහන්සි ගන්නවා. ඔවුන්ගේ ආහාර පිළියෙල වන්නේ ක්‍රමවත් සැලැස්මක් උඩ. පළාතේ සෞඛ්‍ය නිලධාරි මහත්මයා නිතර පැමිණ ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර නවා. එපමණක් නොව පිටත ජීවත්වන ඔවුන්ගේ පවුල්වල අයටද සෞඛ්‍ය පහසුකම් සලසල තියෙන බව අපට අහන්න ලැබුනා.

මොරවැව ගතකළ අන්තිම දවසේ වැදගත් උත්සවයකටද සහභාගි වෙන්න අපට අවස්ථාවක් ලැබුනා. ඒ ළඟදී විවාහවූ හමුදා නිලධාරියෙකුත් ඔහුගේ මනාලියත් පිළිගැනීම වෙනුවෙන් පැවැත්වූවක්. හමුදා භටයින් තුළ කෙතරම් සමගියක්, සහයෝගයක් තියෙන වද කියල ඒ උත්සවයට පෙරදින මුළු රැයම නිදි මරමින් වෙහෙසුන ඔවුන්ගෙන් අපට පැහැදිලි වුනා.

රට සුරැකීමේ සටනේදී මෙන්ම වගා සට නේදීද ජාතිය වෙනුවෙන් ජීවිතය කැප කළ තරුණ ගුවන් හමුදා භට පිරිසක් සමඟ තෙදිනක් ගතකර සුහද ලීලාවෙන් සමුගත් අප නැවත චීනවරායට සේන්දු වෙද්දී හිරු අව රට හැරී තිබුනා. එහිදී යළිත් ගුවන් යානය අහසට නැගෙද්දීත් මොරවැව ගොවි ව්‍යාපාරයේ සේයාව අපේ මතකයේ රැඳී තිබුනා.




"ඒ විතරක් යැ කාසියක් දැම්මහම කෑම බීම සිගරැට් පළියට යන මැෂින් තියෙන්නෙ"